www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරන ව්‍යාපාරයේ හරි මැද යුද තර්ජනය

## Danger of war at centre of Sri Lankan election campaign

**සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂක විජේ ඩයස් විසිනි**

**2005 සැප්තැම්බර් 14**

ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනයේ දිනය නිවේදනය කිරීමටත් පෙරාතුව යුද්ධය පිලිබඳ ප්‍රශ්නය මැතිවරන ව්‍යාපාරයේ හරි මැදට පැමින ඇත. පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) අපේක්ෂක හා වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ, පසුගිය සතියේ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග, දිවයිනේ 20 අවුරුදු ලේ වැකි යුද්ධය යලි ඇවිලීම සඳහා නොවරදින ලෙස මාවත සකසන වර්ගයේ ගිවිසුමක් අත්සන් කලේ ය.

මෙම මැතිවරන ගිවිසුමේ ප්‍රධාන වගන්ති, එක්සත් ජාතික පක්ෂ (එජාප) නායකත්වයෙන් යුත් ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කිරීමෙන් 2002 දී ඇරඹි ඊනියා සාම ක්‍රියාදාමය ඉරා දැමීමකට සම වෙයි. ආරම්භයේ පටන් ම, ජවිපෙ හා සෙසු සිංහල අන්තවාදී සංවිධාන, අවසානයේ 2003 දී ඇන හිටි, සාම සාකච්ඡා රාජ ද්‍රෝහී ක්‍රියාවක් ලෙස හෙලා දැක එම පදනම මත වාර්ගික සතුරුකම් ඇවිලවීමේ ප්‍රයත්නයක යෙදී ගති.

පලමු වගන්තියෙන්, පශ්චාත්-සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය (පී-ටොම්ස්) අහෝසි කිරීමට රාජපක්ෂ එකඟ වේ. පී-ටොම්ස් යනු දෙසැම්බර් 26 සුනාමියෙන් විපතට පත් ජනයාට ආධාර බෙදා දීම සඳහා කොලඹ ආන්ඩුව හා එල්ටීටීඊය අතර තාවකාලික ඒකාබද්ධ යාන්ත්‍රනයක් පිහිටුවනු පිනිස ජුනි මස අත්සන් කරන ලද ගිවිසුමකි. ශ්‍රීලනිප නායිකාව ද වන වත්මන් ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග පී-ටොම්ස් අත්සන් කිරීමට තීන්දු කල විට, ජවිපෙ එම ගිවිසුම “පාවාදීමක්” ලෙස හෙලා දැක සභාග ආන්ඩුවෙන් ඉවත් විය.

ඊලඟ වගන්ති පසුගිය වසර තුන තිස්සේ ජවිපෙ ඉදිරිපත් කල ඉල්ලීම් ලැයිස්තුවකට සම වේ.

“ දෙවන වගන්තිය උතුරු-නැගෙනහිර පලාත්වල කිසි යම් හෝ අන්තර් වාර ස්වයං-පාලන අධිකාරියක් පිහිටුවීම එකහෙලා ම ප්‍රතික්ෂේප කරයි. 2003 දී සාකච්ඡා බිඳ වැටීමෙන් අනතුරුව, එල්ටීටීඊය එවන් අධිකාරියක් පිහිටුවීම සාකච්ඡා යලි ඇරඹීම සඳහා පූර්ව කොන්දේසියක් බවට පත් කලේ ය.

“ තෙවන වගන්තිය දෙවැන්න යලි තහවුරු කරන්නේ, “ඒකීය රාජ්‍ය ව්‍යූහය” ආරක්ෂා කිරීමෙනි. එමගින් මොන යම් හෝ ප්‍රාදේශීය බලය බෙදා හැරීමේ ක්‍රියාදාමයක් ද එනයින් මේ දක්වා සාම සාකච්ඡා සඳහා පැවති සමස්ත පදනම ද ප්‍රතික්ෂේප කරයි.

“ සිවු වන වගන්තිය පවත්නා සටන් විරාම ගිවිසුම සංශෝධනය කල යුතු යැයි ඉල්ලා සිටී. අගෝස්තු 12 දා විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීමෙන් පසුව, ජවිපෙ, ශ්‍රී ලංකා මිලිටරියට වඩා වැඩි බලතල ලැබෙන හා එල්ටීටීඊයට වඩා සීමා පනවන පරිදි සටන් විරාම ගිවිසුම යලි කෙටුම්පත් කරන ලෙස ඉල්ලා සිටින උද්ඝෝෂනයේ පෙරමුනේ ම සිටී.

“ පස් වන වගන්තිය සාම සාකච්ඡා තුල නෝර්වේජියානු පහසුකම් සැලසීමේ ක්‍රියාකලාපය අවසන් කිරීමට රාජපක්ෂ එකඟ කර ගනී. ජවිපෙ හා සෙසු සිංහල ස්වෝත්තමවාදී සංවිධාන නැවත නැවතත් නෝර්වේජියානු නිලධාරින් එල්ටීටීඊයට “පක්ෂපාතී” බවට චෝදනා කරමින් ඔවුන් ශ්‍රී ලංකා භූමියෙන් ඉවත් කරන ලෙස ඉල්ලමින් විරෝධතා සංවිධානය කර ඇත.

ජවිපෙ සමග ගිවිසුම අත්සන් කල රාජපක්ෂ, තමා “සාමය සඳහා” පෙනී සිටින බව ද තමන් යුද උද්ඝෝෂකයෙක් නො වන බව ද වහාම ප්‍රකාශ කලේ ය. සඬුදා අයිලන්ඩ් පත්‍රය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ඔහු වාචාල ලෙස මෙසේ ප්‍රකාශ කලේ යඃ “පියවි සිහියෙන් ඉන්න කාට ද යුද්ධය අවශ්‍ය? මාගේ උද්‍යෝගී පැතුම වන්නේ මෙම අලංකාර රට එලඹෙන සහශ්‍රයේ දී ප්‍රචන්ඩත්වයෙන් තොර රටක් වනු දැකීම යි. . . . පියකු ලෙස, සහෝදරයකු ලෙස හා මේ රටේ සාමය ලැදි පුරවැසියකු ලෙස මා ඔබට කියා සිටින්නේ මෙය යි. මම මේ රට යුද්ධය කරා ඇද වැටීමට කිසිදාක ඉඩ නොදෙමි.”

තමා කෙලින් ම එල්ටීටීඊ නායක වේලුපිල්ලෙයි ප්‍රභාකරන් හමුවීමටත් “සාමය වෙනුවෙන් අවසන් සැතැප්ම යාමටත්” කැමැත්තෙන් සිටින බව ද රාජපක්ෂ නිවේදනය කලේ ය. ඒවායේ මතුපිට ස්වරූපය සැලකූ කල පවා, මෙම පොරොන්දු විකාර සහගත බව පෙනී යයි. සාකච්ඡා සඳහා කලින් පැවති පදනම ඉරා දමා එල්ටීටීඊයේ ඉල්ලීම්

සියල්ල ම ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, රාජපක්ෂට ප්‍රභාකරන් සමග සාකච්ඡා කිරීමට ඇත්තේ මොනවාද? සාමයේ මිනිසකු බවට ඔහු කරන සියලු හිස් ඒකාන්ත ප්‍රකාශ කෙසේ වෙතත්, රාජපක්ෂ වැලඳගෙන ඇත්තේ යුද්ධය සඳහා උද්ඝෝෂනය කරන පක්ෂයකි. ගිවිසුම අත්සන් කල දින පැවති හමුවක් අමතමින් ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ තර්ජනාත්මකව ප්‍රකාශ කලේ, තම පක්ෂය “සාමය වෙනුවෙන් පෙනී සිටින නමුත් යුද්ධය යලි ඇවිලීම සම්බන්ධයෙන් බය නැති” බව යි.

ජවිපෙ සමග ගිවිසුමක් ඇති කර ගැනීමේ රාජපක්ෂගේ තීන්දුව බොහෝ සෙයින් දේශපාලන අවස්ථාවාදයෙන් යුක්ත වේ. ජවිපෙ ඔහුගේ මැතිවරන ව්‍යාපාරයට සහාය දීමටත් තමන්ගේ අපේක්ෂකයෙක් ඉදිරිපත් නො කිරීමටත් එකඟ වී තිබේ. ගිවිසුම ශ්‍රීලනිපයේ කඩා වැටෙන සහයෝගී පදනම්වලට මුක්කුවක් වනු ඇතැයි රාජපක්ෂ බලාපොරොත්තු වේ. කෙසේ වෙතත්, එසේ කිරීම මගින්, ඔහු මැතිවරන ව්‍යාපාරයත් එයින් අනතුරුව සිදු වන වර්ධනයත් වාර්ගික අන්තවාදයේ ආධිපත්‍යයට යටත් කරලීම සහතික කර තිබේ. සිංහල ස්වෝත්තමවාදී ජාතික හෙල උරුමය සමග ද මීට සමාන ගිවිසුමක් අත්සන් කිරීමට ඔහු සැලසුම් කරයි.

## තියුනු විරුද්ධත්වය

ජවිපෙ සමග රාජපක්ෂ ඇති කර ගත් ගිවිසුම ශ්‍රීලනිප තුල කුනාටුවක් නිර්මානය කර ඇත. ගිවිසුම ශ්‍රීලනිප ව්‍යවස්ථාව හා පක්ෂ පිලිවෙත් උල්ලංඝනය කරන බව කුමාරතුංග ප්‍රකාශ කර තිබේ. ජනාධිපතිනිය විශේෂයෙන් ම විවේචනයට ලක් කර ඇත්තේ, පී-ටොම්ස් ගිවිසුම අහෝසි කිරීමේත් මොන යම් ආකාරයක හෝ ප්‍රාදේශීය බලය බෙදා හැරීමේ සැලසුමක් ප්‍රතික්ෂේප කිරීමෙත් අගමැතිගේ ඒකපාර්ශ්වීය තීන්දුව යි. රාජපක්ෂට යවන ලද මාධ්‍යවලට කාන්දු කෙරුනු ලිපියකින් ඇය මෙසේ ප්‍රකාශ කලා යඃ “සාමය ස්ථාපිත කරනු පිනිස ඔබගේ ගිවිසුම හරහා කුමක් සාක්ෂාත් කර ගනු ඇත්දැයි ජාතියටත් මටත් පැහැදිලි කරනු මැනවි.”

කුමාරතුංගගේ විරෝධතා නිසැකව ම කුහක ය. ශ්‍රීලනිප 2001 මහ මැතිවරනය පරාජය වීමෙන් පසුව, එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුම අත්සන් කිරීම හා සාකච්ඡා පැවැත්වීම මගින් “ජාතික ආරක්ෂාවට වල කපා” ඇතැයි එජාප සභාග ආන්ඩුව හෙලා දැකීමෙහි ලා ජවිපෙ සමග එක්වීමට ජනාධිපතිනය පැකිලුනේ නැත. 2004 පෙබරවාරියේ දී, ඇය ජවිපෙ සමග මැතිවරන ගිවිසුමක් අත්සන් කොට, ආන්ඩුව හිතුවක්කාරී ලෙස බලයෙන් පහ කලේ, එජාපයට හා ඔවුන්ගේ සගයන්ට පාර්ලිමේන්තුවේ පැහැදිලි බහුතරයක් පවා තිබිය දී ය. ශ්‍රීලනිප මහ මැතිවරනය ජයගැනීමෙන් පසුව, කුමාරතුංග අංශක 180ක තියුනු හැරීමක් ගෙන තමන් එල්ටීටීඊය සමග සාම සාකච්ඡා යලි අරඹන බවට පොරොන්දු වූවා ය. දැන් ඇය රාජපක්ෂව හෙලා දකින්නේ ඇය කල දෙයක් ඔහු ද කල නිසා ය. එනම්, ජවිපෙ සමග ගිවිසුමක් අත්සන් කිරීම නිසා ය.

කුමාරතුංගගේ පැද්දීම් හා හැරීම් උම්මත්තකයකුගේ මෝඩ ක්‍රියා ලෙස පෙනී යා හැකි ය. එහෙත් ඇගේ ක්‍රියාවන්ට තර්කනයක් ඇත. ඒවා මුල් බැස ඇත්තේ සිවිල් යුද්ධය අවසන් කිරීමට පාලක පන්තියේ කිසිදු කොටසකට පවත්නා නො හැකියාව තුල යි. එජාප මෙන් ම, ශ්‍රීලනිප ද මුල් බැස ඇත්තේ වැඩ කරන ජනතාව වාර්ගික රේඛා ඔස්සේ බෙදීමත් සිය පාලනයට සමාජ පදනමක් නිර්මානය කර ගැනීමත් පිනිස 1948 නිදහසේ පටන් මේ දක්වා පාලක පන්තිය ගසා කා ඇති දෙමල විරෝධී ස්වෝත්තමවාදය තුල ය.

කුමාරතුංගගේ පියා වන සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බන්ඩාරනායක, 1956 සිට 1959 දක්වා අගමැති ලෙස, දෙමල කතා කරන ජනයාට එරෙහිව සෘජුව ම වෙනස්කම් කල “සිංහල පමනක්” පිලිවෙත සඳහා වගකිව යුතු විය. කුමාරතුංගගේ මව සිරිමාවෝ බන්ඩාරනායක, බුද්ධාගම රාජ්‍ය ආගම බවට පත් කල හා දෙමල ජනයාට එරෙහිව වෙනස්කම් කරන සෙසු පිලිවෙත් ක්‍රියාත්මක කල 1972 වාර්ගික ව්‍යවස්ථාව ක්‍රියාවට දැමූ ආන්ඩුවේ නායකත්වය දැරුවා ය. එජාප නායක ජේ.ආර්. ජයවර්ධන විසින් ඉදිරියට ගෙන යනු ලැබූ එම වර්ගවාදී පිලිවෙත් 1983 ජනඝාතනවලට හා සිවිල් යුද්ධයට තුඩු දුනි.

කෙසේ වෙතත්. පසුගිය දශක දෙක තුල භූගෝලීයව සංවිධිත නිෂ්පාදනයේ වර්ධනය ශ්‍රී ලංකාවේ ධනේශ්වරය කලින් පාදක වී සිටි ජාතිකව පරිපාලිත ආර්ථික පිලිවෙත්වලට වල කපා ඇත. කොලඹ සංගත ප්‍රභූන්ගේ අධිපති කොටස් දැන් යුද්ධය සලකන්නේ, ඉවසිය නොහැකි මූල්‍යමය නාස්තියක් ද ආයෝජන ආකර්ෂනය කර ගැනීමේ හා දිවයින භූගෝලීය නිෂ්පාදන සන්තති තුලට ඒකාග්‍ර කිරීමේ සිය සැලසුම්වලට බාධාවක් ද ලෙස ය. මහ බලවතුන්ගේ පිටුබලය ලැබෙන ඊනියා සාම ක්‍රියාදාමය එම අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමේ විධික්‍රමය යි.

1983 සිට 1994 තෙක් යුද්ධය ගෙන ගිය එජාප සහ එහි අපේක්ෂක රනිල් වික්‍රමසිංහ දැන් පෙනී සිටින්නේ සාම දූතයන් ලෙස ය. එහෙත් යුද්ධය මෙන් ම, මෙම “සාමය” ද අනු යන්නේ වැඩ කරන ජනයාගේ දුක් වේදනාවන් තුනී කරලනු පිනිස නොව, ව්‍යාපාරික ප්‍රභූවේ අවශ්‍යතා ඉදිරියට ගෙන යනු පිනිස ය. “සාම ක්‍රියාදාමයේ” ආධාරකරුවන් උත්සාහ කරන්නේ, සිංහල, දෙමල හා මුස්ලිම් ප්‍රභූන් අතර ප්‍රජාතන්ත්‍ර විරෝධී, වාර්ගික පදනමකින් යුක්ත බලය බෙදා ගැනීමේ සැකැස්මක් ඇති කර ගනු පිනිස ය. එවන් සැලසුමක් මගින් විවෘත වෙලඳ පොල ප්‍රතිසංස්කරන වේගවත් කිරීමට, ආයෝජන ආකර්ෂනය කර ගැනීමට සහ කම්කරු පන්තිය අන්‍යොන්‍ය වසයෙන් සූරාකෑම උත්සන්න කිරීමට ඔවුන්ට අවකාශය සලසාලනු ඇත.

කෙසේ වෙතත්, දශකයක් තිස්සේ සිය සැලසුම ක්‍රියාවට දැමීමට පාලක ප්‍රභූ කොටස් අසමත්ව ඇත. ඔවුන්ගේ ආර්ථික අභිලාෂයන් එල්ටීටීඊය ද ඇතුලු ඔවුන් සියල්ලන් ම පදනම්ව සිටින ප්‍රතිගාමී වාර්ගික දේශපාලනය සමග දිගට ම ගැටෙයි. එල්ටීටීඊය සමග ගිවිසුමක් දෙසට ගනු ලැබෙන සෑම පියවරක් ම එය "සිංහල ජාතිය පාවාදීමක්" ලෙස හංවඩු ගසන විරුද්ධවාදීන්ගේ හෙලා දැකීම්වලට තුඩු දෙයි. කුමාරතුංගගේ දේශපාලන බඩ පිනුම් සහ රාජපක්ෂ හා ජවිපෙ අතර මෑත ම ගිවිසුම මෙම අති මූලික උභතෝකෝටිකය පිලිබිඹු කරන අතර සමස්ත සමාජ පර්යායේ ම දේශපාලන බංකොලොත්කම තහවුරු කරයි.

## සමාජවාදී විකල්පයක්

සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයකට සාමය, මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා ශිෂ්ට සම්පන්න ජීවන මට්ටම් අවශ්‍ය බවට සැකයක් නැත. දශක දෙකක යුද්ධයේ ප්‍රතිඵලය ලෙස 60,000කට වැඩි සංඛ්‍යාවක් මරුමුවට පත් වී පන් ලක්ෂයකට අධික ජනතාවකට උන් හිටි තැන් අහිමි වී තිබේ. යලි යුද්ධය ඇවිලීමක් සිදු වුව හොත් තුවක්කු බත් බවට පත් වනු ඇත්තේ කම්කරුවන්ගේ හා ගම්බද දුගීන්ගේ දරුවන් ය. "සාම ක්‍රියාදාමය" සාර්ථක වුව හොත්, දිවයිනේ ගොඩනැගෙන නව ශ්‍රම වහල් කඳවුරු තුල සොච්චමකට කඹුරාලීමට බල කෙරෙනු ඇත්තේ ද ඔවුන්ට ය.

සමාජවාදී සමානතා පක්ෂය (සසප) සමාජවාදී විකල්පයක් ඉදිරිපත් කරනු පිනිස ජනාධිපතිවරනයට තරඟ වදී. එක්කො වික්‍රමසිංහට නැතිනම් රාජපක්ෂට ඕනෑ හැටියට තමන්ව දැක්කීමට ඉඩදීම කම්කරු පන්තියට කල නො හැකි ය. ස්වකීය පන්ති අවශ්‍යතා සඳහා සටන් වැදීමට කම්කරුවන්ට ඇති එකම මාවත නම්, ඔවුන් සියලු ම ධනේශ්වර පක්ෂවලින් ද ජවිපෙ, හෙල උරුමය සහ ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය වැනි සම්ප්‍රදායික කම්කරු පන්තික පක්ෂ වැනි ධනේශ්වර පක්ෂවල වලිගයේ එල්ලී සිටින්නන්ගෙන් ද සිය දේශපාලන ස්වාධීනත්වය තහවුරු කර ගැනීම යි.

සසප යුද්ධය අවසන් කරලනු පිනිස පහත දැක්වෙන සමාජවාදී ක්‍රියාමාර්ගය ඉදිරිපත් කරයිඃ

" දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් සියලුම ආරක්ෂක හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටිනු. ඒකීය රාජ්‍යය බලහත්කාරයෙන් පවත්වා ගෙන යාම දෙමල සුලුතරයට එරෙහිව මුල් බැස ගත් වෙනස්කම් කිරීමකට පමනක් නොව, දිවයින පුරා මිලිටරිවාදයේ ආධිපත්‍යයටත් මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාරයන්ටත් තුඩු දී ඇත.

" සෑම ආකාරයක ම පීඩනයට විරුද්ධ වනු. ජනවර්ගය, භාෂාව හෝ ආගම නො තකා සියල්ලන්ගේ ම අයිතීන් වෙනුනේ පෙනී සිටිනු. 20 අවුරුදු සිවිල් යුද්ධය අවසන් කිරීමේ විසඳුමක් වර්ගෝත්තමවාදය හා ඒකාධිපති විධායක ජනාධිපති ක්‍රමය තහවුරු කරන ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව අහෝසි කිරීමක් ඉල්ලා සිටී. ධනපති දේශපාලනඥ කල්ලිවලට වෙනුවට සාමාන්‍ය වැඩ කරන ජනතාවට ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ නොවිසඳී පවත්නා සියලු ගැටලු ගැන තීන්දු ගැනීමේ අවස්ථාව ලබා දෙන අව්‍යාජ නියෝජනයකින් යුත් ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් පිහිටුවන ලෙස සසප ඉල්ලා සිටී.

" සමාජවාදී පිලිවෙත් සඳහා සටන් වදිනු. ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම සමාජ සමානතාව සඳහා අරගලය සමග බැඳී පවතී. කම්කරු පන්තිය නිර්මානය කරන ධනය සංගතවල ලාභ ඉහල දැමීම පිනිස නොව බහුතරයේ දැවෙන සමාජ අවශ්‍යතා සපුරාලීම පිනිස යොදා ගත හැකි වන පරිදි සමාජය ඉහල සිට පහලට ප්‍රතිසංවිධානය කල යුතු ය. සමාජවාදය සඳහා වඩා පුලුල් අරගලයක කොටසක් ලෙස ශ්‍රී ලංකා ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩනැගීම පිනිස සසප සටන් වදී. ධනවාදය අහෝසි කිරීමේ සාරභූත භූගෝලීය අරගලයේ කොටසක් ලෙස කලාපය පුරා කම්කරුවන් හා පීඩිතයන් ඒකාබද්ධ කිරීමේ හා බලමුලු ගැන්වීමේ විධික්‍රමයක් වසයෙන් දකුනු ආසියාවේ එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් පිලිබඳ සටන් පාඨය සසප ඉදිරිපත් කරයි.

සසප ජනාධිපතිවරනයට තරඟ වදින්නේ එම ඓතිහාසික කර්තව්‍යය ඉටු කරනු පිනිස කම්කරු පන්තියට අවශ්‍ය නව මහජන පක්ෂය ගොඩනගනු සඳහා ය. අපගේ සියලු ආධාරකරුවන්ගෙන් හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* සියලු පාඨකයන්ගෙන් අප ඉල්ලා සිටින්නේ සසප ක්‍රියාමාර්ගය අධ්‍යයනය කොට මෙම පිලිවෙත් සඳහා හැකි තරම් පුලුල් ලෙස උද්ඝෝෂනය කරනු පිනිස අප සමග එක් වන ලෙස යි.

© www.wsws.org